The Journal of Studies in Humanities

Volume 5 (II) 2019

Department of Humanities, Rajarata University of Sri Lanka

# පුරාතන ශ්‍රී ලාංකේය සමාජයෙහි භාවිත චතුර්වර්ණ සංකල්පය

**කුඩාවැවේ සෝමානන්ද හිමි**

සමාජීය විද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය.

Email: somananda.kuda@gmail.com

## Abstract

The purpose of this research is to show the usage of the Cast System in ancient Sri Lankan society. From the ancient time of Sri Lanka, it can be seen through the archeological and literary evidences that Hindu cultural concepts have influenced the Sri Lankan culture. Accordingly, the concept of Caste System has been in operation. It is clear that the Four Castes similar to India have prevailed in ancient Sri Lanka to some extent. It is important to get a good understanding about the word 'Kula' and 'Varna'. In many primary sources, the word 'Kula' has been used to introduce a family or a family unit. There has been another meaning for the word 'Kula'. On some occasions, it has been used to show the difference between high class families and ordinary families. Rich or Noble families have been introduced by the words Kulageya, Mahakula or Isurukula. These families are the units of lay life. This research will explore about the Cast System in ancient Sri Lankan Society.

**Key words:** Ancient Sri Lanka, Cast System, Kula, Varna, Society

## හැඳින්වීම

පුරාතන ශ්‍රී ලාංකේය සමාජ ඉතිහාසය අධ්‍යයනය කිරීමේ දී චතුර් වර්ණ සංකල්පයත් ඊට ආනුෂාංගික කරුණු ශ්‍රී ලාංකේය සංස්කෘතියටත්, පුද්ගල බද්ධ චින්තනය කෙරෙහි මෙන්ම සමාජ පදනම කෙරෙහිත් බලපෑ ඇතිබව සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ඇසුරෙන් ඉස්මතු වේ. මෙරට මුල්ම අවධියේත් ඉන් පසුවත් ශ්‍රී ලාංකේය සමාජ, සංස්කෘතික ආදී ක්ෂේත්‍රයන් කෙරෙහි ඇතැම් පුරාතන ඉන්දීය බ්‍රාහ්මණ සංකල්ප බලපෑ ආකාරය පෙනී යයි. ඒ අනුව ලක්දිව ද මුල් අවධියේ සිටම චතුර්වර්ණ සංකල්පය ක්‍රියාත්මක වී ඇති අයුරු දක්නට ලැබේ. භාරතයේ පැවැති චතුර්වර්ණ කුල ක්‍රමයට සමාන ආකාරයෙන් යුත් කුල සම්ප්‍රදායක් විශේෂයෙන් මුල් අවධියේ ලක්දිව පැවැති බව පැහැදිලි ය. ප්‍රාග් බෞද්ධ යුගයේ මෙන්ම මහින්දාගමනයෙන් පසුවත් ශ්‍රී ලාංකේය සංස්කෘතිය තුළ සතර කුල සංකල්පය පැවැති බව අනාවරණය වේ.

## පර්යේෂණ ගැටළුව

පුරාතන ශ්‍රී ලංකාවේ දේශපාලන, සමාජ සහ සංස්කෘතික තොරතුරු අනාවරණය කර ගැනීමට පුරාතන ශ්‍රී ලංකා සමාජයෙහි චතුර්වර්ණ සංකල්පය භාවිත වූයේ කෙසේ ද යන ගැටලුව ඔස්සේ මෙම පර්යේෂණය සිදු කෙරේ.

## පර්යේෂණයේ අරමුණු

මෙම පර්යේෂණයේදී ප්‍රධාන අරමුණු කිහිපයක් ඔස්සේ කරුණු විමසයි. පුරාතන ශ්‍රී ලංකා සමාජයෙහි චතුර්වර්ණ සංකල්පය භාවිත වූයේ කෙසේද? යන ගැටළුව ඔස්සේ මෙහෙයවුණු මෙම පර්යේෂණය පුරාතන ශ්‍රී ලංකාවේ චතුර් වර්ණ සංකල්පය පිළිබඳව ඇති ඓතිහාසික තොරතුරුවල ස්වරූපය ගෙනහැරපෑම, කුල හා වර්ණ යන වචන භාවිතය හඳුනාගැනීම මෙන්ම ඒ හා සම්බන්ධයෙන් පුරාතන ශ්‍රී ලාංකේය සමාජයෙහි දැකිය හැකි තොරතුරු ඉස්මතු කිරීම යන අරමුණු මූලික කොට මෙම අධ්‍යයනය මෙහෙය වුණි.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනයේදී ප්‍රාථමික මූලාශ්‍රය එනම්, සාහිත්‍යය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය දත්ත රැස්කිරීම සඳහා මූලිකව භාවිත කළ අතර ඓතිහාසික සංසන්දනාත්මක ක්‍රමවේදය හා අන්තර්ගතය විශ්ලේෂණ ක්‍රමවේදය යන පර්යේෂණ ක්‍රමවේද උපයෝගී කරගනිමින් දත්ත විශ්ලේෂණය කරන ලදී.

## සාකච්ඡාව

උක්ත මාතෘකාව පිළිබඳ අධ්‍යයනය කිරීමේදී කුල, වර්ණ යන වචන සහිත්‍ය හා පුරාවිද්‍යාත්මක මුලාශ්‍රයන්හි භාවිත වී ඇත්තේ කෙසේදැයි නිවැරදි අවබෝධයක් ලබාග ැනීම ඉතාමත් වැදගත් වේ. 'කුල' යන වචනය නොයෙකුත් අර්ථයන්හි යෙදී තිබෙන අතර උතුරු ඉන්දියානු හින්දු කුල ක්‍රමය සඳහන් වන අවස්ථාවන්හි එය වර්ණයක් හැඳින්වීම සඳහා යොදා ඇත. 'වා' ධාතුවෙන් නිපැයෙන 'වර්ණ' ශබ්දය කෘෂ්ණ වර්ණය, රක්ත වර්ණය වැනි අරුත්වලත්, ඇතැම් විට අක්ෂර පිළිබඳවත් වර්ණ ගැනත් යොදා තිබේ. එම යෙදීම අනුව, ආර්ය වර්ණ හා දාස වර්ණ[1] නැතහොත් බ්‍රාහ්මණ, ක්‍ෂත්‍රිය, වෛශ්‍ය හා ශුද්‍ර යන පුරාතන භාරතීය සමාජයේ සිවු වර්ණය ගැන සඳහන් වෙයි. (ඍග්වේදය II, 1997:12:4/ඍග්වේදය , 179:6) උදාහරණ වශයෙන් ඛත්තිය, බ්‍රාහ්මණ, වෙස්ස සහ සුද්ද හැඳින්වීමට එය **ධම්පියා අටුවා ගැටපදයේ** යෙදීම ගෙනහැර දැක්විය හැකිය.[2] (ධම්පියා අටුවා ගැටපදය, 1967:216-217) ශිලා ලේඛනවල ද බොහෝවිට එය දක්නට ලැබෙන්නේ එම අර්ථයෙනි. සිද්ධාර්ථ ගෞතම උපත ලත් සූර්ය වංශික ක්‍ෂත්‍රිය පරම්පරාව හැඳින්වීම සඳහා සාහිත්‍ය ග්‍රන්ථ හා ශිලා ලේඛනවල භාවිත කොට ඇත්තේ ද එයයි.[3] (Epigraphia Zeylanica IV, 1944:62/ Epigraphia Zeylanica III, 1933:222-227/ Dighanikaya 1, 1975:87/ Majjhimanikaya II, 1977:134, 164/ Law,1922:181-198) එසේම ක්‍ෂත්‍රිය වංශයට අයත් බව හැඳින්වීම සඳහා බොහෝ සිංහල

1 ''යො දාසං වර්ණමශ්වරං ගෘහාක"; ''උභෞ වර්ණා ඍෂිරුග්‍රඃ පුපොෂ".
2 ''කැත් මහසල් කුල හය බමුණු මහසල් කුලන්... වෙස්ස කුල සුදුරු කුල.''
3 "...මුනිඳු ඉපත් සැහැකුල කෙවුල සුදොනා පරපුරෙන් ආ...."

රජවරු තමන් කැත් කුලයට අයත් බව සඳහන් කළහ. මෙහි කැත් කුලය යන්න යෙදී ඇත්තේ 'ඛත්තියවණ්ණ හෝ ඛත්තියකුල' යන්න බලාගෙනය. තම මව ද ඛත්තිය කුලයටම අයත් බව පැවසීම සඳහා 'එමෙකුල' යන්න ඔවුන් විසින් භාවිත කර තිබේ. (Epigraphia Zeylanica, I, 1912:185,245/EZ, III, 1933:74-727/EZ. IV, 1944: 62)

බොහෝ මූලාශ්‍රවල 'කුල' යන වචනය යම්කිසි පවුලක් හෝ පවුල් ඒකකයක් හැඳින්වීමට ද යොදාගෙන තිබේ. කුල යන වචනය යොදාගත් වෙනත් අර්ථ ද ඇත. මහාවංසයේ දැක්වෙන එක්තරා සේනාපතියෙක් තම බිරිඳගේ සහෝදරයා සමග එනම් පළමුවන කස්සප 'රාජ කුලයෙහි' වස්තුව පැහැර ගැනීම සඳහා කුමන්ත්‍රණය කළේය. (Culavamsa, 1930:38,88-89) මෙහි රාජ කුලයෙහි යන තැනෙහි එය යෙදී ඇත. මෙහි සඳහන් වස්තුව එවිට බෙදා නොතිබූ නිසා 'කුල' යනුවෙන් මෙම ස්ථානයේ සඳහනින් ඒකාබද්ධ පවුල යන්න අර්ථයක් විය යුතුය. (හෙට්ටිආරච්චි, 2008:27) මේ පිළිබඳව එන අනෙකුත් තොරතුරුවලින් පෙනෙන්නේ මෙම රජ පවුලට රජු සහ බිසෝවරු, බිසෝවරුන් දෙදෙනෙකුට අයත් පුතුන් දෙදෙනෙක්, රජතුමාගේ දියණිය, ඇගේ සැමියා සහ රජුගේ සහෝදරිය ද අයත් වූ බවක්ය. (Cv,38:80-83) ඇතැම් විට රජ පවුලේ ආවතේවකාරයින් එයට අයත් වූවා නම් එය ගෘහස්ථ පවුලක් විය හැකිය.

ඇතැම් අවස්ථාවල න්‍යෂ්ටික පවුල ද නැතහොත් ඒකාබද්ධ පවුල යන දෙකින් කුමක් හැඳින්වීම සඳහා කුල යන වචනය යෙදී තිබේ ද යන්න පැහැදිලි කර ගැනීමට අපහසුය. උදාහරණ වශයෙන් තිඹිරිවැව ශිලා ලේඛනයේ එන මිතයගේ දියණිය වූ අනුලා ස්වකීය පවුලට අයත් වස්තුවක්[4] (EZ, Vol. IV, 1944: 222/ හෙට්ටිආරච්චි, එම, පි. 27) සංඝයාට පූජා කළ (EZ IV, 1944: 222) අතර එම වස්තුව න්‍යෂ්ටික පවුලට අයත් වූවක් ද නැතහොත් ඒකාබද්ධ පවුලට අයත් වූවක් ද යන්න නිශ්චිතව හඳුනා ගැනීමට අපහසුය. ඇතැම් තැනක කුල යන වචනය න්‍යෂ්ටික, ඒකාබද්ධ හෝ ගෘහස්ථ පවුල හැඳින්වීම සඳහා යෙදී ඇත. බුද්ධඝෝෂ හිමියන් භික්ෂුවක් ඥාති කුලයක් හා සමීප සම්බන්ධතා පැවැත්වීම කළහොත් උන්වහන්සේගේ පැවිදි ජීවිතයට බාධා එල්ලවන බව පවසයි. (Vissuddhi m, 91) මෙහි සඳහන් ඥාති කුල යන්න කවර කුලයක් සඳහා යෙදී තිබේ ද යන්න අපැහැදිලිය. විසුද්ධිමග්ගයේ සංඝරක්ඛිත නම් භික්ෂුව ඥාති කුලයක් සමග වස් කාලය ගත කල පුවතක් එයි. එහි මෙම වචනය යෙදී ඇති ස්වරූපය මත පෙනීයන්නේ න්‍යෂ්ටික පවුල හැඳින්වීමට බවක්ය. මක්නිසාද යත් එකී පවුලෙහි සිටියේ සැමියා සහ බිරිඳ පමණක් බව සඳහන් වීමෙනි. ඃෂඉසාල 91-92) ඇන්. වාග්ලේ ඥාති කුල යන්න ඒකාබද්ධ පවුල හෝ ගෘහස්ථ පවුල හැඳින්වීමට වෙනත් මූලාශ්‍රවල දැක්වෙන බව පෙන්වා දෙයි. (Wagle, 16-17) බුද්ධ කාලයේ වාසය කළ සුදින්න තෙරුන් ඥාති කුලයක් සමග iïnkaOතාවක් ඇති කරගෙන උන්වහන්සේගේ ගිහි කාලයේ බිරිඳ නැවතත් ආවාහ කරගත්තේය. (Vinaya Pitakaya,Vol. III, 11) මෙම කථාවේ ඥාති දාසිය, සුදින්න තෙරුන්ගේ මව, පියා සහ ගිහි කල බිරිඳ යන සියලු දෙනාම එකම ගෙදරක ජීවත් වූ බව පෙනෙයි. ඒ තුළින් මෙය ඒකාබද්ධ හෝ ගෘහස්ථ පවුලක් බව පෙනෙයි. (හෙට්ටිආරච්චි, 2008:28)

---

4 මෙම සඳහන් 'මතෙරමජිබික' යන්න පරිත්‍යාග කළ වස්තුව ලෙස සලකා ඉන් ඇලවලින් ඇල්ලූ මාලුන් සඳහා අය කළ බද්දක් ලෙස පරණවිතාන මහතා පවසයි. නමුත් ඇස්. බී. හෙට්ටිආරච්චි මහතා වෙනත් අදහසක් පළ කරයි. එනම්, මජ්ඣිම භාණක මහාථෙර යන තේරුම ද ශිලාලිපි ගණනාවකම සඳහන් වෙන හෙයින් මින් කියැවෙන්නේ මජ්ඣිම භාණක මහා ස්ථවිරයන්ට කළ පරිත්‍යාගයක් බවයි.

සමහර අවස්ථාවල මෙම වචනය භාවිත වී ඇති අයුරින් උසස් පවුල්, සාමාන්‍ය පවුල්වලින් වෙන්කොට සැලකීමට යොදාගත් බවක් ද පෙනෙයි. කුලගෙය, මහකුල හෝ ඉසුරුකුල යන වචනවලින් බොහෝ විට ධනවත් නැතිනම් වංශවත් පවුල් හඳුන්වා තිබේ. මෙවැනි පවුල් ගෘහස්ථ පවුල් ඒකකය. දුටුගැමුණුගේ නන්දිමිත්‍ර නැමැති සෙන්පතියා දිනක ආදායම කහාපණ දහසක් වූ කුලගෙයකට අයත් වුණු බව සඳහන් වේ.[5] (සහස්සවත්ථුප්පකරණ, 1959:27) බොහෝවිට කුල ගෙයකට සේවකයෝ වූහ. (එම, 32, 148) සාමාන්‍ය පවුලකට දාසයන් හෝ සේවක සේවිකාවන් තබා ගැනීමට නොහැකි වූ අතර ධනවත් පවුල් 'කුලගෙය' යන වචනයෙන් කියැවේ. (Ellawala, 1969:77) වංශවත් පුද්ගලයන් සඳහා 'කුලපුත්ත' හෝ 'කුලීන' යනුවෙන් හඳුන්වා තිබේ. එමනිසා 'කුලගාම' යන්න වංශවතුන් ජීවත් වූ ගම් හෝ ඔවුන් භුක්ති විඳින ලද ගම් හෝ විය හැකිය. (CV. 38:12,38; XCII:22; 1960:29, 205)

මහ පවුලක් 'මහකුල' යන වචනය යොදා ඇත. මෙය සනාථ වන්නේ සමන්තපාසාදිකාවේ මහකුලයක් නිසා කුල ගණනාවක්ම ජීවත්වන බව සඳහන් වීමෙනි. (Smp.Vol. II, 57) මහකුලයක සේවය කළ පවුල් රාශියක් තිබූ අතර එහි විවිධ සේවකයන් මෙන්ම කුලීකරුවන් ද සේවයේ නියුතුව ඉඳ තිබේ. මෙවැනි පවුල් ගෘහස්ථ පවුල්ය. (හෙට්ටිආරච්චි, 2008:30.)

'ඉසුරුකුල' යන්න ද යෙදී තිබෙන්නේ ධනවත් පවුල් සඳහාය. ධම්පියා අටුවා ගැටපදයේ පාලි 'අඩ්ඪකුල' යන වචනයට යෙදී ඇත්තේ 'ඉසුරුකුල' යනුවෙනි. (ධම්පියා අටුවා ගැටපදය, 131) රසවාහිනියේ යෙදී තිබෙන 'කුටුම්බික' යන වචනය වෙනුවට මහාවංසයේ 'ඉසුරු' යන වචනය යොදා ඇත. උදාහරණ වශයෙන් සුරනිමලගේ පියා වන සංඝ 'කුටුම්බික' යනුවෙන් රසවාහිනියේ සඳහන් කර ඇති අතර මහාවංසය 'ඉස්සර' යනුවෙන් ද සඳහන් වීම පෙන්වා දිය හැකිය. (Mv, 23:55/රසවාහිනි, II, 83/ Ellawala, 1969:30) 'කුටුම්බික' යනු වත්පොහොසත්කම් ඇති පුද්ගලයෙක් වන අතර ධම්පියා අටුවා ගැටපදයේ 'කුටුම්බික' යන්න යොදා තිබෙන්නේ එම අර්ථයෙනි. (ධම්පියා අටුවා ගැටපදය, 9, 223) මෙකී තේරුමම මින් ගෙනහැරපාන බව ත්‍රිපිටකයෙහි පමණක් නොව සංස්කෘත ග්‍රන්ථවලත් බෙහෙවින්ම සඳහන් වීමෙන් පැහැදිලි වේ. (Vinaya pitaka,Vol. III, 184; IV, 80, 177, 272)

ඇතැම් තැනක 'ජාති' යන වචනය 'දෑ' යනුවෙන් කුලය හැඳින්වීමට යොදා තිබේ. සිඛවලද විනිසේ 'දෑ' යන්න ඛත්තිය, බ්‍රාහ්මණ, වෙස්ස හා චණ්ඩාල හැඳින්වීමට යොදා ඇත.[6] (සිඛවලඳ සහ සිඛවලඳ විනිස, 1950:43.) ධම්පියා අටුවා ගැටපදයේ ද 'වර්ණය' වෙනුවට 'ජාති' යන පදය භාවිත කෙරේ.[7] 'සමජාතික' යනුවෙන් අඹුසැමි දෙදෙනා එකම කුලයකට අයත් නම් ඔවුන්ගේ දරුවන් හැඳින්වීමට යොදයි.

---

5 ''දිවසේ දිවසේ සහස්සුප්පාදන කුලගෙහෙ''

6 "මෙහි දෑ...... මෙසෙයින් දන්නෝ, සැඬල්හි කැතයෙහි යනාදී හීන උකට දෑයි"

7 "ජාති නම් බමුණු ජැය"

මහාවංසයේ නන්දිවාපි ගාමයෙහි වාසය කළ දාඨාගේ දරුවන් දෙදෙනා වූ ධාතුසේන හා සිලාතිස්සබෝධි සමජාතික වශයෙන් හඳුන්වා ඇත. (CV, 38, 14-15) 'සමදෑ' යන්න සමජාති යන්නෙහි සිංහල අනුරූපය වන අතර මව සහ පියා එකම කුලයට හා සමාජ මට්ටමකට අයත් බව පෙන්වීමට යොදා තිබේ. සිව්වැනි මහින්ද රජතුමා (ක්‍රි. ව. 956 - 972) රඹෑව පුවරු ලිපියේ තම මව වූ දේවා (Ibid, 52, 64) පියා හා සමදෑ බව පවසයි. (EZ, 67; V, 85) එසේම ත්‍රිපිටකයේ ද 'ජාති' යන්නට 'වර්ණ' ලෙස යොදා ඇති විවිධ අවස්ථා දක්නට ලැබේ. (Vinaya Pitakaya,Vol. III, 169/ Anguttaranikaya,Vol. 1, 162.) ජී. එස්. ගුර්යේ වර්ණ යන්නෙන් සිවු වැදෑරුම් ප්‍රධාන කුල සහ ජාති යන්නෙන් ඒවායෙහි අනුබෙදීම් හැඳින්වී ඇතැයි සඳහන් කළ ද එය නිශ්චිතව කිව හැකි නොවේ. ජාති යන්න වර්ණය හැඳින්වීමට කිසිඳු වෙනසකින් තොරව යොදා තිබේ. මුල් අවධියෙහි භාරතීය සමාජයේ සිවු වර්ණය බ්‍රාහ්මණ, ක්‍ෂත්‍රිය, වෛශ්‍යය හා ශුද්‍ර ලෙස දක්වයි.

(ඍග්වේදය, 2,12, 4) ඇතැම් විද්වතුන්ගේ අදහස වන්නේ මෙම වර්ණයන්ගේ ආරම්භය වෛදික කාලයටත් පෙර සිදු වූ බවත් ආර්යයන් විසින් මෙය විකාශනයට පත්කළ බවත්ය. පූර්ව වෛදික කාලයේ (ඍග්වේදය, 10, 90. 2.) පශ්චාත් වෛදික කාලයෙහිත් (යජුර්වේදය, 31, 10-1) සිවු වර්ණය බ්‍රහ්මගේ විවිධ අංගවලින් උපන් බව දක්වන අතරම ඔවුන්ගේ කාර්යභාරය ද සඳහන් වේ. (එම, 30, 5.)

බෞද්ධ සාහිත්‍යයෙහි ද නොයෙක් අවස්ථාවල සිවු වර්ණය ගැන සඳහන්ය. ඒ අනුව මේ පිළිබඳව අදහස් රාශියක් දීඝනිකායේ පාටික වර්ගයේ අග්ගඤ්ඤ සූත්‍රයේ දැක්වෙන අතර එහි ක්‍ෂත්‍රිය, බ්‍රාහ්මණ, වෛශ්‍යය හා ශුද්‍ර යන කුල සතර ඇති වූ ආකාරය සඳහන් වෙයි.[88] (දී.නි. පාටික වග්ග, අග්ගඤ්ඤ.) මෙරට රචිත විවිධ සාහිත්‍යමය ග්‍රන්ථයන්හි ද සිවු වර්ණය පිළිබඳව සඳහන්ය. ජාතක අටුවා ගැටපදය, අටදාසන්නය වැනි ග්‍රන්ථයන්හි ක්‍ෂත්‍රිය, බ්‍රාහ්මණ, වෛශ්‍ය, ශුද්‍ර ලෙසින් කුල ගැන සඳහන් වේ. (ජාතක අටුවා ගැටපදය, 1967:55.)

ක්‍රි. ව. දාහතර වැනි සියවසට අයත් ගඩලාදෙණි පර්වත ලිපියේ ද සතර කුලය ඒ අයුරින්ම ගෙනහැර පායි. (අමරවංශ හිමි, 1969:426.) එනමුත් පූජාවලියේ එක් අවස්ථාවක චතුර්වර්ණය රජ බමුණු, වෙළෙඳ, ගොවි යනුවෙන් දක්වා ඇත. (පූජාවලිය, 174.) එහිම තවත් අවස්ථාවක ද සිවු වර්ණය ගෙනහැර පා ඇත. (එම, 606.) ජාතක ගාථා සන්නයේ ක්‍ෂත්‍රිය, බ්‍රාහ්මණ, වෛශ්‍ය, ශුද්‍ර, චණ්ඩාල, පුක්කුස ආදී (ඛත්තියා, බ්‍රාහ්මණ, වෙස්සා, සුද්දා, චණ්ඩාල, පුක්කුසා) වශයෙන් කුල පිළිබඳව සඳහන් කරයි. (ජාතක ගාථා සන්නය, 1927: 250) තවද පූජාවලියේ රජ, සිටු, බමුණු, වෙළඳ කුලවල උපන්නෝ ශ්‍රිවන්තයෝ වෙතියි සඳහන් කරයි. (පූජාවලිය, 606.) 'සිරිමත්' යන්න මහ පිනැත්තන්ට කියැවෙන්නකි. (රුවන්මල පියුම්මල, 1982:64) මෙමඟින් පැහැදිලි වන්නේ මෙම කුලයන්හි උප්පත්තිය ලැබුවෝ ශ්‍රී වන්තයෝ හැටියට සැලකූ බවය. ජාතක අටුවා ගැටපදයේ 'නිස්සෝ කුල සම්පත්තියා' යනුවෙන් විග්‍රහ කරමින් ක්‍ෂත්‍රිය බ්‍රාහ්මණ, වෛශ්‍ය යන තුන් කුල සම්පත්තීන් (ජාතක අටුවා ගැටපදය, 55) යන ලෙසින් ද තවත් අවස්ථාවක දී රජ, බමුණු, වෙළඳ තුන් කුල සපුව (එම, 17) යනුවෙන් යෙදෙන්නේය. මෑත අවධියෙහි රචිත සිරිලක් කඩයිම් පොතේ ද

8( ''තුම්හෙ ඛිමත්ථ වාසෙට්ඨා නානාජච්චා නානානාමා නානා ගොත්තා නානාකුලා අගාරස්මා අනගාරියං පබ්බජිතා'ත''කෙ තුම්හෙ''ති පුට්ඨා සමානා, ''සමණා සක්‍යපුක්තියම්හාති පටිජානාථ''

රජ, බමුණු, වෙළෙඳ, ගොවි, වංශවල ඉපිද සැප විඳින ලෙස අවසානයෙහි සඳහන් කොට තිබේ. (සිරිලක් කඩයිම් පොත, 1961:20) එහෙත් වෛශ්‍ය කුලය මෙන්ම ශුද්‍ර කුලය ද ඒ ආකාරයෙන්ම නීච කුල සෙයින් සලකා ඇති අයුරු ධම්පියා අටුවා ගැටපදයේ සඳහන් වේ. (ධïපියා අටුවා ගැටපදය, 214) එසේම රජ කුලය හෝ බමුණු කුලය හෝ උසස් බවත් මෙකී කුල දෙක හැර අනෙකුත් කුල නීච බවත් ධර්මප්‍රදීපිකාවේ දැක්වෙයි. (ධර්මප්‍රදීපිකාව, 1959: 233) ජාතක අටුවා ගැටපදයේ ද කියැවෙන්නේ "ක්ෂත්‍රිය බ්‍රාහ්මණා දී කුල සම්පත්තිය ද දේවලෝකෝත්පත්තිය ද පිරිසිදු බව සිදුවන බවට නොහොත් සමෘද්ධ වන බවට කාරණා හෙයින්..." යනුවෙනි. (ධම්පියා අටුවා ගැටපදය, 63) මෙමඟින් ද ගම්‍යවන්නේ ක්‍ෂත්‍රියන් හා බ්‍රාහ්මණයන් යන කුල දෙක පමණක් උසස් බවත් අනෙක් කුල පහත් කුලයන් ලෙසටත් සලකා ඇති බවත්ය. සිද්ධාර්ථ කුමරුන් පිළිසිඳ ගැනීමට පෙර වූ පංච මහා විලෝකනයෙහි එන එක් අංගයක් වූයේ ද කුලයයි. සියලුම බුදුවරු නූපදින කුල ගොවිකුලය මෙන්ම වෙළඳ කුලයත් ඇතුළත් වන අතර ඔවුහු බ්‍රාහ්මණ හෝ රජ කුලයෙහි හෝ පමණක් උත්පත්තිය ලබන බව පැවසෙති. (පූජාවලිය, 109/සද්ධර්ම රත්නාවලිය, 1174.) 'ශාක්‍යසිංහ' යන රජ කුලය හා අනුබද්ධිත නාමයක් වන අතර එය බුදුරජාණන් වහන්සේ හැඳින්වීමට යොදාගනු ලැබූ නම් අතරින් එකකි. (අභිධානප්පදීපිකාව - පාළි නිඝණ්ඩුව, 1929:3) අමාවතුර¾ ශාක්‍ය කුමාරවරුන් පන්සියයක් පැවිද්ද ලබා ගැනීම සම්බන්ධිත විස්තරයේ දී සඳහන් වන්නේ බුදුන් ද ඒ සඟුන් ද මහා සම්මත රාජවංශයෙහි උපන්නාහු බැවින් 'බුදුහු තුමූහු පිරිසිදු වූවාහු පිරිසිදු සඟුන් පිරිවරා වැඩ හුන්නාහු' බවක්ය. (අමාවතුර, 1959:220) එයම පූජාවලිය කතුවරයා රජ කුලෙන් බුදුව රජ මහණුන් පිරිවරන ලද බව ගෙනහැර පායි. (පූජාවලිය, 548) මෙමඟින් පැහැදිලිවන්නේ කුල පවිත්‍රතාව පිළිබඳ කිසියම් හැඟීමක් භික්‍ෂු සමාජයෙහි ද කුල ගර්වය සම්බන්ධයෙන් තිබුණු මූලික අවස්ථාවක් ලෙසය. තවද උසස් මෑණියන්ට දාව කුසකින් ඉපදීම දරුවකුට විශාල ගෞරවයක් ලෙස සලකා ඇති අවස්ථා පෙනෙයි. ලක්දිව ඇතැම් ශිලා ලේඛනයන්හි රාජ රාජ මහාමාත්‍යාදීන් අසවල් අයගේ කුසින් උපන් බව දැක්වෙන අවස්ථා රාශියක් පෙනේ. ඒ අනුව, පුලියන්කුලම පුවරු ලිපියේ 'කුලෙන් සම දෑ කිනා රැජින කුසින්..., (සිංහල කතිකාවත් හා භික්‍ෂු සමාජය, 1985:64) සතරවැනි සේන රජුගේ කළුදියපොකුණ ලිපියේ 'මහරජ්හු පිණිසැ... විදුරා රැජ්න කුස්හි...', (එම, 67) වෙස්සගිරි පුවරු ලිපියක 'මහරජ්හට දා දෙවා රැජ්න කුස්හි හෙවැ...' (එම, 62) ආදි ලෙස සඳහන් වන අයුරින් පැහැදිලි වේ. ඒඅනුව කුල හා වර්ණ යන්න විවිධ අර්ථයෙන් භාවිත වන අයුරු පෙන්වා දිය හැකිවෙයි.

## සමාලෝචනය

ඉහත සඳහන් සාධක තුළින් පැහැදිලි වන්නේ කුල, ජාති හෝ වර්ණ යන වචන ඒවායේ පැරණි සිංහල රූප සමඟ යොදා තිබෙන්නේ ඉන්දියාවේ සේ බ්‍රාහ්මණ ඉගැන්වීම්වල එන චතුර්වර්ණය හැඳින් වීමට බව පෙනෙයි. ප්‍රාග් බෞද්ධ ශ්‍රී ලාංකේය සමාජයේත් ඉන්පසුවත් ශ්‍රී ලංකේය සමාජයේ කිසියම් අයුරකින් ඉහත කී සතරකුල සංකල්පය පැවැතුණි. එය සාහිත්‍ය මෙන්ම පුරාවිද්‍යාත්මක සාධක තුළින් සනාථ කරගත හැක.

## පරිශීලිත ග්‍රන්ථ

### ප්‍රාථමික මූලාශ්‍රය

**අභිධානප්පදීපිකාව -පාළි නිඝණ්ඩුව,** (1929). සංස්. මොරගොල්ල ඤාණොභාස තිස්ස හිමි, කලුවාමෝදරඃ ඒ. ඇල්. ඩී. සිල්වා.

**ඍග්වේදය** II, (1997). පරි. නාරාවිල පැට්රික්, කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

**ජාතක අටුවා ගැටපදය,** (1967). සංස්. මැදඋයන්ගොඩ විමලකීර්ති හිමි සහ නැහින්නේ සොමිස්සර හිමි, කොළඹඃ ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

**සහස්සවත්ථුප්පකරණ,** (1959). සංස්. පොල්වත්තේ බුද්ධදත්ත හිමි, කොළඹඃ ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

**අමාවතුර,** (1959). සංස්. කෝදාගොඩ ඤාණලෝක හිමි, කොළඹඃ ඇම්. ඩි. ගුණසේන සහ සමාගම.

**ධම්පියා අටුවා ගැටපදය,** (1967). සංස්. මැදඋයන්ගොඩ විමලකීර්ති හිමි සහ නැහින්නේ සෝමිස්සර හිමි,

කොළඹඃ ඇම්. ඩි. ගුණසේන සහ සමාගම.

**ධර්මප්‍රදීපිකාව,** (1959). සංස්. අමරමොලි හිමි, කොළඹඃ ශ්‍රී ලංකා ප්‍රකාශන සමාගම.

ඒ. වී. සුරවීර, **සිංහල කතිකාවත් හා භික්ෂු සමාජය,** කොළඹඃ ඇම්. ඩි. ගුණසේන සහ සමාගම, 1985, පි. 1985, 64.

**සිඛවලඳ සහ සිඛවලඳ විනිස,** (1950). සංස්. මැදඋයන්ගොඩ විමලකීර්ති හිමි සහ හීනිපැල්ලේ ඉන්දවංස හිමි, අනුර මුද්‍රණාලය.

**සිරිලක් කඩයිම් පොත,** (1961). ශ්‍රී චාල්ස් ද සිල්වා, කොළඹඃ ඇම්. ඩි. ගුණසේන සහ සමාගම.

**Culavamsa,** (1930). W. Geiger, London: Oxford University Press.

**Dighanikaya 1.** (1975). ed. T.W. Rhys Davids & Etlin Carpenter, London: P.T.S.

**Epigraphia Zeylanica I,** (1912). ed¡ D. M. D. Z. Wicramasingha, London: Oxford University Press,

**Epigraphia Zeylanica III,** (1933). ed¡ S. Paranavitana, London: Oxford University Press.

**Epigraphia Zeylanica IV,** (1944). ed¡ S. Paranavitana, London: Oxford University Press.

**Majjhimanikaya II,** (1977). ed. Robert Chalmer, London: P.T.S.

### ද්විතීය මූලාශ්‍රය

අමරවංශ හිමි, කොත්මලේ (1969). **ලක්දිව සෙල්ලිපි,** කොළඹඃ ඇම්. ඩි. ගුණසේන සහ සමාගම.

හෙට්ටිආරච්චි, ඇස්. බී. (2008). **ලංකාවේ සමාජ හා සංස්කෘතික ඉතිහාසය,** මහරගමඃ තරංජී ප්‍රින්ට්ස්.

Ellawala, (1969). H. **Social History of Early Ceylon,** Colombo: Department Of Cultural Affairs.

Law, B. C. (1922). **Ksatriya Clans in Buddhist India,** Culcutta: Thacker, Sprink & com.